**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා) උපාධි වැඩසටහන - හයවන මට්ටම**

**අවසාන පරීක්ෂණය - 2015**

**අන්තර්කරණ අධ්‍යාපනය – ESU4118**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 අප්‍රේල් 08 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ඌනතාව, දුබලතාව සහ බාධිත බව ඔබේ වචනයෙන් විස්තර කරන්න.

02. විශේෂ අධ්‍යාපන සේවාවන් ලැබීමට සුදුසු ළමයින් වර්ග පහක් (05) නම් කරන්න.

03. බහු සංස්කෘතික අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන ප්‍රධාන ඉගෙනුම් ඉලක්ක හතරක් (04) සඳහන් කරන්න.

04. බුද්ධිමය දුබලතා සහිත සිසුන්ගේ ගුණාංග පහක් (05) සඳහන් කරන්න.

05. ඩවුන් සින්ඩ්‍රෝම් සහිත ළමයින් පෙන්නුම් කරන ශාරීරික ලක්ෂණ පහක් (05) සඳහන් කරන්න.

06. දෘෂ්ටි ඌනතා සහිත දරුවෙකු විසින් නිතර පැමිණිලි කරන දෘෂ්ටි ඌනතාවයට සම්බන්ධ පන්ති කාමරයට අදාල ගැටලු පහක් (05) ලියන්න.

07. ඇසීමේ ක්‍රියාවලිය කෙටියෙන් විස්තර කරන්න.

08. අන්තර්කරණ සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) වර්තමාන පන්ති කාමරයක දැකිය හැකි විවිධත්වය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) පන්ති කාමර විවිධත්වයට ආමන්ත්‍රණය කිරීම සඳහා අන්තර්කරණ දර්ශණය සහ අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය ඉවහල් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 12)

10. (i) ශ්‍රී ලංකාවේ විශේෂ අධ්‍යාපනයේ විකාශනය සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ඒකීකරණය හා අන්තර්කරණය අතර ඇති වෙනස්කම් තුනක් (03) උදාහරණ සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 12)

11. (i) සුහග දරුවන් තුළින් දක්නට ලැබෙන කැපී පෙනෙන ගති ලක්‍ෂණ හතරක් (04) විස්තර කරන්න (ලකුණු 08)

(ii) සුහග දරුවන් වෙනුවෙන් මැදිහත්වීමට පාසල් විෂයමාලාවට ඇතුළත් කර ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ හැකි දේ විස්තර කරන්න. (ලකුණු 12)

12. (i) ඔටිසම් සහිත කාණ්ඩයේ ළමයින් තුළින් දැකිය හැකි පොදු ලක්‍ෂණ හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(ii) ඔවුන්ගේ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමට පන්ති කාමරයේදී යොදාගත හැකි උපක්‍රම උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 12)

13. (i) ඉගෙනුමට ඇති බාධා යන්න නිර්වචනය කරන්න. (ලකුණු 08)

(ii) ඉගෙනුමට බාධා කරවන පාරිසරික සාධක තුනක් (03) උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 12)

14. (i) ඉගෙනුම් දුබලතාවය ඔබේ වචනයෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ii) සුවිශේෂී ඉගෙනුම් දුබලතා සහිත සිසුන් කාණ්ඩ හතරක් (04) නම් කොට ඉන් සිසුන් කාණ්ඩ දෙකක් (02) හඳුනා ගන්නේ කෙසේදැයි උදාහරණ සහිතව විස්තර කරන්න.

හිමිකම් ඇවිරිණි. (ලකුණු 14)